මාඕ සේතුං

පොතට වහල් වීමට විරුද්ධ වන්න

LIBERATIONBASE
ඩිජිටල් පුස්තකාලය

ඩිජිටල් පුස්තකාලය සහ ලේඛණ සංරක්ෂණ ව්‍යාපෘතිය
ආරම්භය (*NMSG Library* ලෙස): 2010
LIBERATIONBASE ලෙස නැවත නාමකරණය: 2013

සූචිකරණ දත්ත
කෘතිය: පොතට වහල් වීමට විරුද්ධ වන්න
කතෘ/පරිවර්තක: මාඕ සේතුං/-
ප්‍රකාශක: ප්‍රජා ප්‍රකාශකයෝ, කොළඹ
පළමු ඩිජිටල් පළ කිරීම: 2019-05-31
ඩිජිටල් සංස්කරණයන්: V1:2019-05-29
පිටු ගණන: 17
භාෂා මාධ්‍ය: සිංහල
ගොනු ආකෘතිය: PDF

Web: https://liberationbase.wordpress.com
Email: slradical@ymail.com

LIBERATIONBASE

මාඕ සේතුං

පොතට වහල් වීමට විරුද්ධ වන්න

ප්‍රජා ප්‍රකාශකයෝ
කොළඹ
1970

පළමුවැනි මුද්‍රණය: 1968, අප්‍රේල්
දෙවැනි මුද්‍රණය: 1970, නොවැම්බර්

ප්‍රකාශකයාගේ සටහන

සහෝදර මාඕ සේතුංගේ **පොතට වහල් වීමට විරුද්ධ වන්න** නම් වූ මේ ලිපිය සිංහලට නඟනලද්දේ පීකිං නුවර විදේශ භාෂා මුද්‍රණාලය මගින් 1967දී ප්‍රසිද්ධ කරනලද **මාඕ සේතුංගේ කෘති වලින් තෝරාගත් ලිපි** නමැති පොතේ ඉංග්‍රීසි පිටපතෙහි එන එම ලිපියෙන් ය. මෙහි ඇතුළත් සටහන් ද එකී පොතේ එම ලිපිය සමග යොද ඇති සටහන් ම ය.

මේ සිංහල පිටපත දෙවැනි මුද්‍රණයේදී තව දුරට ත් දියුණු කර ඇත.

කොළඹ 10, ජයන්ත වීරසේකර මාවතේ අංක 19 දරණ තැන ප්‍රජා ප්‍රකාශකයෝ සමාගමේ සේවයේ නියුක්ත මීගොඩ පතිරණගේ දයානන්ද (මුද්‍රණශිල්පියා) විසින් එම ස්ථානයේ පිහිටි ප්‍රජා මුද්‍රණාලයේ මුද්‍රණය කරනලදුව ප්‍රජා ප්‍රකාශකයෝ (ප්‍රකාශකයා) විසින් ප්‍රසිද්ධ කරනලදී.



LIBERATIONBASE

LIBERATIONBASE
ඩිජිටල් පුස්තකාලය

ඩිජිටල් පුස්තකාලය සහ ලේඛණ සංරක්ෂණ ව්‍යාපෘතිය
ආරම්භය (*NMSG Library* ලෙස): 2010
LIBERATIONBASE ලෙස නැවත නාමකරණය: 2013

සූචිකරණ දත්ත
කෘතිය: පොතට වහල් වීමට විරුද්ධ වන්න
කතෘ/පරිවර්තක: මාඕ සේතුං/-
ප්‍රකාශක: ප්‍රජා ප්‍රකාශකයෝ, කොළඹ
පළමු ඩිජිටල් පළ කිරීම: 2019-05-31
ඩිජිටල් සංස්කරණයන්: V1:2019-05-29
පිටු ගණන: 17
භාෂා මාධ්‍ය: සිංහල
ගොනු ආකෘතිය: PDF

Web: https://liberationbase.wordpress.com
Email: slradical@ymail.com

පොතට වහල් වීමට විරුද්ධ වන්න

I. විමසාබැලුවේ නැත් නම්, කතා කිරීමට අයිතිය නැත

LIBERATIONBASE

ඔබ ප්‍රශ්නයක් විමසාබලා ඇත් නම් මිසක්, ඔබ එගැන කතා කිරීමට ඇති අයිතියට අහිමි වෙනවා ඇත. එය රළුකරළු වැඩි නැද්ද? පොඩ්ඩක් වත් නැත. ඔබ ප්‍රශ්නයක් ඇතුළට ම, වර්තමාන සත්‍ය කරුණු සහ ඒ ප්‍රශ්නයේ අතීත ඉතිහාසය ඇතුළට ම, හාරා අවුස්සා සොයා බලා නැත් නම් ද, එහි අවශ්‍ය ම දේ ගැන කිසිවක් නො දන්නෙහි නම් ද, ඔබ එගැන කියන කවරක් වේවා නිසැකයෙන් ම අනම්මනම් වෙනවා ඇත. අනම්මනම් කතා කිරීම, හැම දෙනා ම දන්නා පරිදි, කිසි ම ප්‍රශ්නයක් නො විසඳයි; එසේ කල ඔබ කතා කිරීමේ අයිතියට අහිමි කිරීම අයුක්තිසහගත වන්නේ ඇයි? බොහෝ සහෝදරවරු සැම විට ම තම ඇස් වසා තබා ගනිමින්, අනම්මනම් කතා කරති; කොමියුනිස්ට්වාදියකුට එය නින්දසහගත ය. කොමියුනිස්ට්වාදියකුට තම ඇස් වසා තබා ගනිමින්, අනම්මනම් කතා කළ හැකි වන්නේ කෙසේ ද?

ඒක හරියන්නේ නැත!

ඒක හරියන්නේ නැත!

ඔබ විමසාබැලිය යුතු යි!

ඔබ අනම්මනම් කතා නො කළ යුතු යි!

II. ප්‍රශ්නයක් විමසාබැලීම එය විසඳීම වේ

ඔබට ප්‍රශ්නයක් විසඳන්නට බැරි ද? හොඳයි, එහෙනම් බිමට බැස, වර්තමාන සත්‍ය කරුණු සහ ඒ ප්‍රශ්නයේ අතීත ඉතිහාසය විමසාබලන්න! ඔබ ප්‍රශ්නය හොඳ හැටි විමසාබැලූ කල, එය විසඳන සැටි ඔබ දැනගන්නවා ඇත. නිගමනයන් එක්වැනි ව ම එන්නේ විමසාබැලීමෙන් පසු ව ය, කලින් නො වේ. කිසි ම විමසාබැලීමක් නො කොට, ''විසඳුමක් සෙවීම'' පිණිස හෝ ''අදහසක් ඇති කර ගැනීම'' පිණිස හෝ තමා ම, නැතහොත් පිරිසක් සමග එක් ව, තම මොළයට වධ දෙන්නේ තකතිරුවෙක් පමණකි. මෙයින් කිසි ම විපාකදයක විසඳුමක් කරා හෝ කිසි ම හොඳ අදහසක් කරා පැමිණෙන්නට පුළුවන්කමක් නැති බව තරයේ ම කිව යුතු ය. වෙන වචන වලින්, ඔහු වැරදි විසඳුමක් කරා සහ වැරදි අදහසක් කරා එළඹෙනු නියත ය. කිසියම් තැනකට පැමිණි මොහොතේ ම දේශපාලන දේශනාවන් කරන්නට කැමති වන, තමන් දක ඇත්තේ ඒ ඒ දේවල් වල මතුපිට හෝ සුළු විස්තර පමණක් නමුත් මේක විවේචනය කරමින්, අරෙක හෙළා දකිමින් උදුරම් ලෙස එහෙමෙහෙ යන එන, පරීක්ෂණ වැඩ කරන සහෝදරවරුන් ද, එසේ ම

අළුත පදවියට පත් වූ ගොරිල්ලා නායකයන් සහ කාඩර්වරුන් ද සිටින්නේ සුළු ගණනක් නො වේ. එබඳු තනිකර ම මනෝමූල අනම්මනම් කතා සත්තකින් ම පිළිකුල් කටයුතු ය. ඒ මිනිසුන් හැම දෙයක් ම අවුලක් කිරීම, බහුජනයාගේ විශ්වාසය නැති කර ගැනීම සහ කිසි ම ප්‍රශ්නයක් විසඳන්නට කොහෙත් ම සමත් නැති බව ඔප්පු වීම නියත ය.

දුෂ්කර ප්‍රශ්න ඉදිරිපත් වූ කල, නායක පදවි වල සිටින මිනිසුන් බොහෝ දෙනා ඒවා විසඳන්නට බැරි ව නිකම් සුසුම් හෙළති. ඉවසිල්ල නැති වන ඔව්හු, තමන්ට ''සමත්කම නැත, වැඩය කරන්නට බැරි ය'' යන ප්‍රතිෂ්ඨාව උඩ වෙන තැනකට මාරු කරන ලෙස ඉල්ලති. මේවා බියගුල්ලන්ගේ වචන ය. ඔබගේ දෙපය නගා ගමන්කරන්ට පටන් ගන්න, ඔබගේ බාරයේ තබා ඇති හැම කොටසක් ම වටේ යන්න, කොන්පියුසියස් කළාක් මෙන් ''හැම දෙයක් ම පිරික්සා බලන්න''[1]; එවිට, ඔබගේ සමත්කම කොතරම් අල්ප වුව ද, ප්‍රශ්න විසඳීමට ඔබට පුළුවන් වෙනවා ඇත; කවර හෙයින් ද යත් ඔබ දොට්ට බහින විට ඔබගේ හිස හිස් ව තිබෙන්නට පුළුවන් නමුත්, ඔබ ආපසු එන විට එය තව දුරට ත් හිස් ව නො තිබෙනවා ඇත, ප්‍රශ්න විසඳීමට අවශ්‍ය නොයෙක් විධියේ කරුණු එහි අඩංගු වී තිබෙනවා ඇත; වැලිත් ප්‍රශ්න විසඳන සැටි එසේ ය. ඔබ දොට්ට බැසිය යුතු ම ද? අවශ්‍ය ම නැත. ඔබ දුෂ්කර ප්‍රශ්නයක් ය'යි කියන දෙයේ නිධානය කරා යනු වස් තත්වය ගැන හොඳට දන්නා මිනිසුන් කැඳවා සත්‍ය කරුණු සෙවීමේ රැස්වීමක් පවත්වා, එය දන් තිබෙන සැටි දැනගන්නට ඔබට හැකි ය; එවිට ඔබගේ දුෂ්කර ප්‍රශ්නය විසඳීම පහසු වෙනවා ඇත.

LIBERATIONBASE

විමසාබැලීම ගැබ් මෝරන දීර්ඝ මාස වලට ත් ප්‍රශ්නයක් විසඳීම දරු උපත සිදුවන දිනයට ත් සමාන කළ හැකි ය. ප්‍රශ්නයක් විමසාබැලීම, සත්තකින් ම, එය විසඳීම වේ.

III. පොතට වහල් වීමට විරුද්ධ වන්න

පොතක ලියා තිබෙන කොයි දෙයක් වුව ත් හරි ය— සංස්කෘතික වශයෙන් නොදියුණු චීන ගොවියන්ගේ මානසිකත්වය තවම ත් එසේ ය. පුදුමයකට මෙන්, කොමියුනිස්ට් පක්ෂය තුළ ත් සාකච්ඡාවකදී ''එය පොතේ ලියා තිබෙන තැන මට පෙන්වන්න''යි සැම විට ම කියන මිනිස්සු සිටිති. නායකත්වයේ ඉහළ අවයවයක නිර්දේශය නිවැරදි ය'යි අප කියන කල, එසේ කියන්නේ එය ''නායකත්වයේ ඉහළ අවයවය'' වෙතින් එන නිසා නො ව, එහි අඩංගු දේ අරගලයේ විෂයමූල සහ මනෝමූල වටාපිටා තත්වයන්ට අනුරූප වන නිසා ත් එහි අවශ්‍යතාවන් පිරිමසන නිසා ත් ය. හුදෙක් ඉහළ අවයවයක් වෙතින් එන නිසා සැබෑ තත්වයන්ගේ ආලෝකයෙන් නිර්දේශ සාකච්ඡා නො කොට, පරීක්ෂා නො කොට, චාරිත්‍රගරුක ආකල්පයක් ගනිමින් අන්ධ ලෙස ඒවා ක්‍රියාවේ යෙදීම වැරදි ය. පක්ෂයේ ක්‍රියාමාර්ගය සහ උපක්‍රම බහුජනයා අතර දනට වඩා ගැඹුරට මුල් නො බසින හේතුව පැහැදිලිවන්නේ මේ චාරිත්‍රගරුකත්වය නිසා සිදුවන අනර්ථයෙන් ය. ඉහළ අවයවයකින් ලැබුණු නිර්දේශයක් අන්ධ ලෙස ත්, පෙනීමට එකඟනොවීමක් නොමැතිව ත් ක්‍රියාවේ යෙදීම එය ඇත්ත වශයෙන්

ක්‍රියාවේ යෙදීමක් නො වේ, ඊට විරුද්ධ වීමේ හෝ එය කඩාකප්පල් කිරීමේ ඉතා ම කපටි විධිය වේ.

සමාජ විද්‍යාවන් පොත් වලින් පමණක් ම අධ්‍යයනය කිරීමේ ක්‍රමය ද එසේ ම අතිශයින් ම අනතුරු සහිත ය, අයකු ප්‍රති–විප්ලවයේ මගට සමුණුවන්නට පවා ඉඩ තිබේ. සමාජ විද්‍යා අධ්‍යයනයේදී තමන් පොත් වලට ම සීමා කරගත් චීන කොමියුනිස්ට්වාදියෝ කට්ටි පිටින් ම ප්‍රති–විප්ලවවාදින් බවට හැරී සිටිති යන සත්‍ය කරුණෙන් මෙ ගැන පැහැදිලි සාක්ෂියක් ලැබේ. මාක්ස්වාදය නිවැරදි ය'යි අප කියන කල, ඒ ඇත්ත වශයෙන් ම මාක්ස් ''අනාගත වක්තෘවරයකු'' වූ නිසා නො ව, ඔහුගේ න්‍යායය නිවැරදි බව අපේ භාවිතාවේදී සහ අපේ අරගලයේදී ඔප්පු වී තිබෙන නිසා ය. අපේ අරගලයේදී අපට මාක්ස්වාදය උවමනා ය. අප ඔහුගේ න්‍යායය පිළිගැනීමේදී ''අනාගතවාක්‍ය'' ගැන ඇතිවන විධියේ භක්තිවාදි හෝ ගූඪ හැඟීමක් කිසි විටෙක අපේ සිත් තුළට පිවිසෙන්නේ නැත. මාක්ස්වාදි පොත් කියවා තිබෙන බොහෝ දෙනා විප්ලවයෙන් පළාගිය ද්‍රෝහීන් වී සිටින අතර, නූගත් කම්කරුවෝ බොහෝ විට ඉතා හොඳින් මාක්ස්වාදය වටහා ගනිති. සත්තකින් ම අපි මාක්ස්වාදි පොත් අධ්‍යයනය කළ යුත්තෙමු; එහෙත් මේ අධ්‍යයනය අපේ රටේ නියම තත්වයන් සමග සමස්ත කළ යුත්තෙමු. අපට පොත් උවමනා ය, එහෙත් අපි, සැබෑ තත්වයෙන් වියෝග වූ, පොතට ම වහල් වීම පිටුදැකිය යුත්තෙමු.

පොතට වහල් වීම පිටුදකින්නට අපට කෙසේ හැකි වේ ද? එක ම මග සැබෑ තත්වය විමසාබැලීම යි.

LIBERATIONBASE

IV. නියම තත්වය විමසාබැලීමක් නොමැත්තේ නම්, ප්‍රතිඵලය වශයෙන් එක්කෝ අවස්ථාවාදය, නැතහොත් කුමන්ත්‍රණවාදය ඇති වන, පංක්ති බලවේගයන් පිළිබඳ විඥනවාදි තක්සේරුවක් සහ වැඩ කිරීමේදී විඥනවාදි මගපෙන්වීමක් ඇතිවනු නියත ය

ඔබ මෙ නිගමනය සැක කරන්නෙහි ද? සත්‍ය කරුණු එය පිළිගන්නට ඔබට බල කරනවා ඇත. කිසි විමසාබැලීමක් නො කොට දේශපාලන තත්වය තක්සේරු කිරීමට හෝ අරගලයට මග පෙන්වීමට හෝ නිකම් උත්සාහ කර බලන්න; එබඳු තක්සේරුවක් හෝ මග-පෙන්වීමක් ප්‍රතිෂ්ඨා විරහිත සහ විඥනවාදි වේ ද නැද්ද කියා, නැතහොත් එය අවස්ථාවාදි හෝ කුමන්ත්‍රණ-වාදි වැරදි කරා පමුණුවන්නේ ද නැද්ද කියා එවිට ඔබට පෙනී යනවා ඇත. සත්තකින් ම එය එසේ වෙනවා ඇත. මෙසේ වන්නේ ක්‍රියා කිරීමට කලින් සැලකිලිමත් ලෙස සැලැස්ම කිරීමට අසමත් වීම නිසා නො වේ; අපේ රතු හමුද ගොරිල්ලා ඒකක වල බොහෝ විට සිදු වන්නාක් මෙන්, සැලැස්ම කිරීමට කලින් ඒ ක්‍රියාවට අදළ ව පවතින සමාජ තත්වය සැලකිලිමත් ලෙස අධ්‍ය-යනය කිරීමට අසමත් වීම නිසා ය. ලි කුළුයි[2] වගීයේ නිලධාරි, වැරදි වලට මිනිසුන්ට දඬුවම් කරන විට කිසි ම වගවිභාගයක් නො කරති. ප්‍රතිඵලයක් වශයෙන්, තමන්ට අසාධාරණ ලෙස සංග්‍රහ කරනලද්'යි වැරදි කළ අය හඟිති,

බොහෝ ආරවුල් පැනනඟී, නායකයන්ගේ ගරුත්වය නැති වී යයි. රතු හමුදවෙහි නිතර ම මේ දේ සිදු නො වේ ද?

බහුජනයා අපේ පැත්තට දිනා ගැනීමට සහ සතුරා පරාජය කිරීමට අප සමත් වීමට පෙර, අපි විඥනවාදය පිස දැමිය යුත්තෙමු, සියලු අවස්ථාවාදි සහ කුමන්ත්‍රණවාදි වැරදි වලින් පරෙස්සම් විය යුත්තෙමු. විඥනවාදය පිස දැමීමට තිබෙන එක ම මග ප්‍රයත්න දරා නියම තත්වය විමසාබැලීම ය.

V. සමාජ සහ ආර්ථික විමසාබැලීමේ අරමුණ පංක්ති බලවේගයන් පිළිබඳ නිවැරදි තක්සේරුවක් කරා එළඹී, ඉක්බිති අරගලය සඳහා නිවැරදි උපක්‍රම සකස් කිරීම ය

අප විසින් සමාජ සහ ආර්ථික තත්වයන් විමසාබැලිය යුත්තේ මන්ද යන ප්‍රශ්නයට අපේ පිළිතුර මෙය යි. ඒ අනුව, අපේ විමසාබැලීමේ විෂයය වන්නේ සියලු සමාජ පංක්ති ය, කඩ කඩ වූ සමාජ ප්‍රපංච නො වේ. මෑතක සිට, රතු හමුදවේ සිව්වැනි හමුදවේ සහෝදරවරුන් සාමාන්‍යයෙන් විමසාබැලීමේ වැඩයට අවධානය යොමු කර ඇත;[3] එහෙත් ඔවුන් බොහෝ දෙනා යොදන ක්‍රමය වැරදි ය. එහෙයින් ඔවුන්ගේ විමසාබැලීමේ ප්‍රතිඵල කුළුබඩු වෙළෙන්දකු තබන ගණන්හිලව් මෙන් අල්ප ය, නැතහොත් හද්ද පිටිසරයකු ටවුමට ආ කල ඔහුට අසන්නට ලැබෙන බොහෝ අරුම පුදුම කතන්දර වැනි ය, නැතහොත් ඈත කඳු මුදුනක සිට පෙනෙන ජනාකීර්ණ

LIBERATIONBASE

නගරයක දර්ශනයක් බඳු ය. මේ විධියේ විමසාබැලීම් වලින් ඇත්තේ මඳ ප්‍රයෝජනයකි, එයින් අපේ ප්‍රධාන අදහස ඉටු වන්නේ නැත. අපේ ප්‍රධාන අදහස විවිධ සමාජ පංක්ති වල දේශපාලන සහ ආර්ථික තත්වය උගෙනීම ය. අපේ විමසාබැලීමේ ප්‍රතිඵලය විය යුත්තේ එක් එක් පංක්තියේ වර්තමාන තත්වය ද එහි වර්ධනයේ නැඟීම් හා බැසීම් ද පිළිබඳ චිත්‍රයකි. උදාහරණ වශයෙන්, අප ගැමිජනතාව සැදී සිටින සැටි විමසාබලන විට, අප දැනගත යුත්තේ බදුකර සබඳතාවන් අනුව ප්‍රභේද වන අයිතිකාර–ගොවියන්ගේ, අර්ධ–අයිතිකාර ගොවියන්ගේ සහ බදු–ගොවියන්ගේ ගණන පමණක් නො වේ; පංක්තිය හෝ තට්ටුව අනුව ප්‍රභේද වන පොහොසත් ගොවියන්ගේ, මැද ගොවියන්ගේ සහ දිළිඳු ගොවියන්ගේ ගණන අපි වඩාත් විශේෂයෙන් දැනගත යුත්තෙමු. අප වෙළෙන්දන් සැදී සිටින සැටි විමසාබලන කල, අප දැනගත යුත්තේ ධාන්‍ය, රෙදිපිළි, බෙහෙත් බඩු යනාදිය වැනි එක් එක් වෙළඳාමෙහි යෙදී සිටින ගණන පමණක් නො වේ; සුළු වෙළඳුන්ගේ, මධ්‍යම වෙළඳුන්ගේ සහ ලොකු වෙළඳුන්ගේ ගණන අපි වඩාත් විශේෂයෙන් දැනගත යුත්තෙමු. අප විමසාබැලිය යුත්තේ එක් එක් වෙළඳාමෙහි තත්වය පමණක් නො වේ. ඒ වෙළඳාම තුළ පවතින පංක්ති සබඳකම් වඩාත් විශේෂයෙන් විමසාබැලිය යුතු ය. අප විමසාබැලිය යුත්තේ විවිධ වෙළඳාම් අතර පවතින සබඳතාවන් පමණක් නො වේ; විවිධ පංක්ති අතර සබඳතාවන් වඩාත් විශේෂයෙන් විමසාබැලිය යුතු ය. අපේ විමසාබැලීමේ ප්‍රධාන ක්‍රමය විය යුත්තේ විවිධ සමාජ පංක්ති විච්ඡේද කිරීම ය; එහි අවසාන පරමාර්ථය වනුයේ විප්ලවවාදි අරගලයේදී ප්‍රධාන බලවේගය වන්නේ කොයි පංක්ති ද, මිත්‍රපාක්ෂිකයන්

වශයෙන් අපේ පැත්තට දිනා ගත යුතුව සිටින්නේ කොයි පංක්ති ද, පෙරළාදැමිය යුතුව සිටින්නේ කොයි පංක්ති ද කියා පැහැදිලි කරමින්, ඒ විවිධ සමාජ පංක්ති අතර පවතින අන්‍යෝන්‍ය සබඳකම් තේරුම් ගැනීම, පංක්ති බලවේගයන් පිළිබඳ නිවැරදි තක්සේරුවක් කරා එළඹීම සහ, ඉක්බිති අරගලය සඳහා නිවැරදි උපක්‍රම සකස් කිරීම ය. අපේ එක ම අදහස මෙය යි.

විමසාබැලීම අවශ්‍ය සමාජ පංක්ති මොනවා ද? ඒවා මෙසේ ය:

කර්මාන්තමය නිර්ධනපංක්තිය
හස්තකර්මාන්ත කම්කරුවෝ
ගොවි කුලීකරුවෝ
දිළිඳු ගොවියෝ
නගරබද දිළිඳු ජනයා
නන්නත්තාර–නිර්ධනපංක්තිය
ස්වාමි හස්තකර්මාන්තකාරයෝ
සුළු වෙළෙන්දෝ
මැද ගොවියෝ
පොහොසත් ගොවියෝ
ඉඩම්හිමියෝ
වාණිජ ධනේශ්වරපංක්තිය
කර්මාන්තමය ධනේශ්වරපංක්තිය

අපේ විමසාබැලීමේදී අපි මේ සියලු ම පංක්ති වල හෝ තට්ටු වල තත්වය කෙරෙහි අවධානය යොමු කළ යුත්තෙමු. අප දැනට වැඩ කරන ප්‍රදේශ වල නැත්තේ කර්මාන්තමය නිර්ධනපංක්තිය ත් කර්මාන්තමය

LIBERATIONBASE

ධනේශ්වරපංක්තිය ත් පමණකි; සෙසු සියලු දෙනා අපට නිතර ම හමුවෙති. අපේ අරගල උපක්‍රම මේ සියලු පංක්ති සහ තට්ටු සම්බන්ධයෙන් යොදන උපක්‍රම ය.

අප අතීතයේදී කළ විමසාබැලීම් වල තිබුණු තවත් බරපතල අඩුලුහුඩුකමක් නම් ටවුම ගැන නො තකමින් පිටිසර ම උවමනාවට වඩා බර කොට සැලකීම ය; එසේ හෙයින් බොහෝ සහෝදරවරු සෑම විට ම නගරබද දුප්පතුන් සහ වාණිජ ධනේශ්වරපංක්තිය කෙරෙහි අනුගමනය කරන අපේ උපක්‍රම ගැන නොපැහැදිලි වැටහීමක් ඇතුව සිටිති. අරගලයේ වර්ධනය නිසා අපට කඳු අතහැර තැනිතලාවන් කරා එන්නට හැකි වී ඇත.[4] අපි කායික වශයෙන් පහළ බැස සිටිමු; එහෙත් අපි මානසික වශයෙන් තවම ත් කඳු වල සිටිමු. අපි පිටිසර මෙන් ම ටවුම් ද තේරුම් ගත යුත්තෙමු; නැතහොත් විප්ලවවාදී අරගලයේ උවමනාවන් ඉටු කරන්නට අප අසමත් වෙනවා ඇත.

VI. චීනයේ විප්ලවවාදී අරගලයේ ජයග්‍රහණය චීන තත්වයන් ගැන චීන සහෝදරවරුන්ගේ අවබෝධය මත රඳා පවතිනවා ඇත

අපේ අරගලයේ අරමුණ ප්‍රජාතන්ත්‍රවාදයේ අවස්ථාව ඔස්සේ සමාජවාදය කරා එළඹීම ය. මේ කර්තව්‍යයේදී, පළමුවැනි පියවර වනුයේ ඉඩම්හිමි පංක්තිය, අධිරාජ්‍යවාදය සහ කුඔමින්තාං පාලනය පෙරළා දැමීම පිණිස කම්කරු පංක්තියේ වැඩිපිරිස දිනා ගැනීමෙන් ද ගොවි බහුජනයා හා නගරබද දිළිඳු ජනයා පුබුදු කිරීමෙන් ද

ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවය සම්පූර්ණ කිරීම ය. ඊළඟ පියවර වනුයේ මේ අරගලයේ වර්ධනය උඩ ඊට පසු ව එන සමාජවාදී විප්ලවය කරගෙන යාම ය. මේ ශ්‍රේෂ්ඨ විප්ලවවාදී කර්තව්‍යය ඉටු කිරීම සුළු හෝ පහසු වැඩක් නො වේ; එය මුළුමනින් ම නිර්ධනපංක්ති පක්ෂයේ නිවැරදි වූ ත් තරසර වූ ත් උපක්‍රම මත රඳා පවතිනවා ඇත. ඒ පක්ෂයේ අරගල උපක්‍රම වැරදි නම්, නැතහොත් අනිස්ථිර සහ වැනෙනසුලු නම්, විප්ලවය තාවකාලික පරාජයට භාජන වෙනවා ඇත. ධනේශ්වර පක්ෂ ද නිතර ම තමන්ගේ අරගල උපක්‍රම ගැන සාකච්ඡා කරන බව සිත තබා ගත යුතු ය. කම්කරු පංක්තිය මුළා කොට, කොමියුනිස්ට් පක්ෂයේ නායකත්වයෙන් ඉවතට හරවනු පිණිස ඒ පංක්තිය අතර ප්‍රතිසංස්කරණවාදී බලපෑම් පතුරුවන්නේ කෙසේ දැ'යි, දුප්පත් ගොවියන්ගේ කැරලිගැසීම් මැඩලනු පිණිස පොහොසත් ගොවියන් යොදවන්නේ කෙසේ දැ'යි, විප්ලවවාදී අරගල මර්දනය කරනු පිණිස මැරයන් සංවිධානය කරන්නේ කෙසේ දැ'යි ඒ පක්ෂ කල්පනා කර කර සිටී. පංක්ති සටන වඩ වඩා උග්‍ර වන්නා වූ ත්, ළං ළං ව කරනු ලබන්නා වූ ත් තත්වයක් තුළ, නිර්ධනපංක්තිය ස්වකීය ජයග්‍රහණය පිණිස තමන්ගේ ම පක්ෂයේ, එනම් කොමියුනිස්ට් පක්ෂයේ, නිවැරදි, නොවැනෙනසුලු අරගල උපක්‍රම මත මුළුමනින් ම රැඳී සිටිය යුතු ව ඇත. කොමියුනිස්ට් පක්ෂයක නිවැරදි සහ නොවැනෙනසුලු අරගල උපක්‍රම, කිසි ම වටාපිටා තත්වයක් යටතේ, කාර්යාලයක් තුළ වාඩි වී සිටින මිනිසුන් කීප දෙනකුන් විසින් නිර්මාණය නො කළ හැකි ය; ඒවා බහුජන අරගලය කරගෙන යන අතර, ඒ කියන්නේ, සැබෑ අත්දැකීම තුළින්, බිහි වේ. එහෙයින්, අපි හැම කල්හි ම සමාජ තත්වයන් හැදෑරිය යුත්තෙමු,

LIBERATIONBASE

ප්‍රායෝගික විමසාබැලීම් කළ යුත්තෙමු. අනම්‍ය වූ, ගතානුගතික වූ, භක්තිවාදී වූ සහ ප්‍රතිෂ්ඨා රහිත ලෙස ශුභවාදී වූ සහෝදරවරු වර්තමාන අරගල උපක්‍රම පරිසමාප්ත ය'යි, පක්ෂයේ හයවැනි ජාතික සම්මේලනයේ "ලියවිලි පොත"[5] සදකාලික ජයග්‍රහණය සහතික කරන්නේ ය'යි, හුදෙක් ස්ථාපිත ක්‍රමයන්ට නියැලී සිටීමෙන් අයකුට සැම විට ම ජයග්‍රාහී විය හැකි ය'යි සිතති. මේ අදහස් ඒකාන්තයෙන් ම වැරදි ය; කොමියුනිස්ට්වාදීන් අරගලය තුළින් හිතකර වූ අළුත් තත්ව නිර්මාණය කළ යුතු ය යන අදහස හා පොදු වූ කිසිවක් ඒවාට නැත; ඒවා තනිකර ම ගතානුගතික ක්‍රියාමාර්ගයක් නියෝජනය කරයි. මේ ක්‍රියාමාර්ගය සම්පූර්ණයෙන් ම ඉවත නො දැම්මොත්, එයින් විප්ලවයට මහත් අලාභහානි සිදු වෙනවා ඇත, මේ සහෝදරවරුන්ට ම හානි සිදු වෙනවා ඇත. ඒ ඒ දේ තිබෙන සැටියෙන් ම තිබෙන්නට ඉඩ හැරීමෙන් සෑහීමට පත් වන, කිසි ම දෙයක් හොඳ හැටි ම අවබෝධ කර ගන්නට නො සොයන, ප්‍රතිෂ්ඨා විරහිත ලෙස ශුභවාදී වූ යම් යම් සහෝදරවරු පැහැදිලි ලෙස ම අපේ රතු හමුදාවේ සිටිති; ඔව්හු "මෙය නිර්ධනපාංක්තික ය" යන මිථ්‍යාව ද පතුරුවති. ඔව්හු කට බඩ පුරා කා බී, විමසාබැලීම පිණිස බහුජනයා අතරට යාමට කිසි විටෙක අඩියක් වත් සොලවන්නේ නැතිව, දවස තිස්සේ ම තම කාර්යාල තුළට වී නිදි කිරති. ඔව්හු යම් විටක කට අරිත් ද, එවිට ඔවුන්ගේ පල්හෑලි මිනිසුන්ට එපා වේ. මේ සහෝදරවරුන් අවදි කරනු පිණිස, අපි අපේ හඬ නඟා ඔවුන්ට මෙසේ කෑගා කිව යුත්තෙමු:

පමා නො වී ඔබගේ ගතානුගතික අදහස් වෙනස් කරන්න!

ඒවා වෙනුවට ප්‍රගතිශීලී සහ සටන්කාමී කොමියුනිස්ට් අදහස් ගන්න!

අරගලයට බහින්න!

බහුජනයා අතරට ගොස්, සත්‍ය කරුණු විමසා බලන්න!

VII. විමසාබලන විධිය

1. සත්‍ය කරුණු සොයන රැස්වීම් පවත්වා, සාකච්ඡා මගින් විමසාබැලීම් කරන්නට පටන් ගන්න.

සත්‍යය කරා ළඟා වීමට තිබෙන එක ම මග, නිගමනයන් ඇති කරගැනීමට තිබෙන එක ම මග, මෙය යි. ඔබ සාකච්ඡාවන් මගින් විමසාබැලීම් කරනු පිණිස සත්‍ය කරුණු සෙවීමේ රැස්වීම් නො පවත්වා, හුදෙක් තමාගේ ම අත්දැකීම් කියන එක් පුද්ගලයකු මත විශ්වාසය තබා වැඩ කරන්නෙහි නම්, වැරදි කිරීම පහසු වේ. ඔබ සාකච්ඡාව සඳහා මුඛ්‍ය ප්‍රශ්න නඟන්නේ නැති ව නිකම් ඕනෑවට එපාවට ප්‍රශ්න අසන්නෙහි නම්, එබඳු රැස්වීම් වලදී බොහෝ දුරට නිවැරදි නිගමන ඇති කරගැනීමට ඔබට පුළුවන්කමක් නැත.

2. සත්‍ය කරුණු සෙවීමේ රැස්වීම් වලට පැමිණිය යුත්තේ මොන විදියේ මිනිස්සු ද?

ඔව්හු සමාජ සහ ආර්ථික තත්වයන් ගැන හොඳට දැනුම් තේරුම් ඇති මිනිස්සු විය යුත්තාහ. වයස සම්බන්ධයෙන්, ඉතා ම හොඳ වයසක මිනිස්සු ය; ඔවුන් අත්දැකීමෙන් ආඪ්‍ය නිසා ත් සිදු වෙමින් තිබෙන දේ දන්නවා පමණක් නො ව හේතු ඵල ඔවුන්ට තේරෙන නිසාත් ය.

ප්‍රගතිශීලි අදහස් සහ තියුණු ඇස් තිබෙන නිසා, අරගලය ගැන අත්දැකීම් ඇති තරුණ අය ද ඇතුළත් කළ යුතු ය. කරන රක්සාව සම්බන්ධයෙන්, කම්කරුවන්, ගොවියන් වෙළෙන්දන්, උගතුන් සහ, ඉඳහිට සෙබළු ද, ඇතැම් විට දඩාවතේ යන අය ද, සිටිය යුත්තාහ. ස්වභාවයෙන් ම, එක්තරා විෂයයක් ගැන විමසාබලන විට, ඒ විෂයය ගැන කිසි ම සම්බන්ධයක් නැති අය සිටිය යුතු නො වෙති. උදහරණ වශයෙන්, විමසාබැලීමේ විෂයකරුණ වාණිජ්‍යය වන කල, කම්කරුවන්, ගොවියන් සහ ශිෂ්‍යයන් පැමිණීම අවශ්‍ය නො වේ.

3. වඩා හොඳ කොයි එක ද, සත්‍ය කරුණු සෙවීමේ ලොකු රැස්වීමක් ද, කුඩා එකක් ද?

මෙය රඳා පවතින්නේ රැස්වීමක් හසුරුවන්නාට විමසාබලන තැනැත්තාට ඇති සමත්කම මත ය. ඔහු ඒ වැඩයට හපන් නම්, මිනිසුන් දස දෙළොස් දෙනකුන්, නැතහොත් විස්සක් හෝ ඊට වඩා පවා සිටින රැස්වීමක් කැඳවිය හැකි ය. ලොකු රැස්වීමක ඊට අයත් වාසි තිබේ; පිළිතුරු වලින් ඔබට තරමක් හරියට ම හරි සංඛ්‍යා ලේඛන (නිදසුන් වශයෙන්, මුළු ගොවි ජනගහනයෙහි සිටින දිළිඳු ගොවියන්ගේ සියයට ගණන සෙවීමේදී) සහ තරමක් හරියට ම හරි නිගමන (නිදසුන් වශයෙන්, වඩා හොඳ සමාන ලෙස හෝ වෙනස් ලෙස ඉඩම් බෙදා දීම ද යනු සෙවීමේදී) ලැබේ. සත්තකින් ම, ඊට අයත් අවාසි ද ඊට ඇත්තේ ය; ඔබ රැස්වීම් හසුරුවන්නට සූර නැත්නම්, එය සන්සුන් ව තබාගැනීම ඔබට දුෂ්කර වෙනවා ඇත. එහෙයින් රැස්වීමකට පැමිණෙන මිනිසුන්ගේ ගණන විමසාබලන්නාගේ දක්ෂතාව මත රඳා පවතී. කෙසේ වේවා, අඩු ම ගණන තුන ය; නැතහොත් ලබා ගන්නා

තොරතුරු සැබෑ තත්වයට අනුරූප නො වන තරමට සීමාසහිත වෙනවා ඇත.

4. විමසාබැලීම සඳහා සවිස්තර කටුසටහනක් පිළියෙළ කරන්න.

සවිස්තර කටුසටහනක් කලින් පිළියෙළ කළ යුතු ය, විමසාබලන්නා ඒ කටුසටහන අනුව ප්‍රශ්න ඇසිය යුතු ය, රැස්වීමට පැමිණ සිටින අය තමන්ගේ පිළිතුරු දෙනවා ඇත. නොපැහැදිලි වූ ත් සැකසහිත වූ ත් කවර කරුණක් වේවා සාකච්ඡාවට ඉදිරිපත් කළ යුතු ය. සවිස්තර කටුසටහනට ප්‍රධාන විෂයයන් සහ උප-ශීර්ෂ ද, සවිස්තර මාතෘකා ද ඇතුළත් විය යුතු ය. නිදසුන් වශයෙන්, වාණිජ්‍යය ප්‍රධාන විෂයය වශයෙන් ගත් විට, ඊට රෙදිපිළි, ධාන්‍ය, වෙනත් අවශ්‍ය දේ සහ බෙහෙත් බඩු ආදි වශයෙන් උප-ශීර්ෂ තිබෙනු හැකි ය; යළි, රෙදිපිළි යටතේ, කැලිකෝ, ගෙදර වියාපුරෙදි, සිල්ක් සහ සැටින් ආදි වශයෙන් සවිස්තර මාතෘකා තිබෙනු හැකි ය.

5. පුද්ගලික වශයෙන් සහභාගි වීම.

නියම්ගම් ආණ්ඩුවක සභාපතිගේ සිට මධ්‍යම ආණ්ඩුවේ සභාපති තෙක්, බලඇණි නායකයකුගේ සිට ප්‍රධාන-අණදෙන්නා තෙක්, පක්ෂ ශාඛාවක ලේකම්ගේ සිට ප්‍රධාන ලේකම් තෙක්—නායකත්වය දීම ගැන වගකීම් ඇති හැම කෙනෙක් ම අදාළ ව පවතින සමාජ සහ ආර්ථික තත්වයන් විමසාබැලීම පුද්ගලික වශයෙන් ම බාරගත යුතු ය, හුදෙක් වාර්තා කියවීම මත ම විශ්වාසය නො තිබිය යුතු ය. විමසාබැලීම ත් වාර්තා කියවීම ත් මුළුමනින් ම වෙනස් කරුණු දෙකක් නිසා ය.

6. ගැඹුරට ම හාරා අවුස්සා බලන්න.

LIBERATIONBASE

විමසාබැලීමේ වැඩයට අළුත් වූ කවරෙක් වේවා, එක්තරා ස්ථානයක් ගැන (ගමක් හෝ ටවුමක් ගැන ය'යි කියමු) හෝ එක්තරා ප්‍රශ්නයක් ගැන (ධාන්‍ය හෝ කාසි පිළිබඳ ප්‍රශ්නය ගැන ය'යි කියමු) සම්පූර්ණ දැනුමක් ලබා ගනු වස් හොඳහැටි ම විමසාබැලීම් එකක් දෙකක් කළ යුතු ය. එක්තරා ස්ථානයක් හෝ ප්‍රශ්නයක් ගැඹුරට ම හාරා අවුස්සා බැලීම වෙනත් ස්ථාන සහ ප්‍රශ්න ගැන අනාගතයේදී කරන විමසාබැලීම් පහසු කරනවා ඇත.

ඔබගේ ම සටහන් සාදා ගන්න.

විමසාබලන්නා කළ යුත්තේ සත්‍ය කරුණු සෙවීමේ රැස්වීම් වල මුලසුන ගෙන, පැමිණ සිටින අයට නිසි ලෙස මග පෙන්වීම පමණක් නො වේ; ඔහු තමාගේ ම සටහන් සාදා ගැනීම ත් ප්‍රතිඵල තමා විසින් ම වාර්තා කර ගැනීම ත් කළ යුතු ය. අනුන් ලවා එය කරවා ගැනීම හොඳ නැත.

1930, මැයි

LIBERATION BASE

ස ට හ න්

1 කොන්ෆියුසියානු සුභාෂිතය, IIIවැනි පොත, "පා යි" බලන්න: "කොන්ෆියුසියස් මුතුන්මිත්තන්ගේ දෙවොලට පිවිසි කල, ඔහු හැම දෙයක් ම පිරික්සා බැලුවේ ය."

2 ලි කුඑයි උතුරු සුං රජපෙළපතේ (960-1127) අවසාන හරියේදී සිදු වූ ගොවි යුද්ධය විස්තර කරන ශුයි හු චුආන් (වගුරුබිම් වල වීරයෝ) නැමති සුප්‍රසිඩ චීන නවකථාවෙහි එන වීරයෙකි. ඔහු චාම්, කෙළින් කතා කරන, ගොවියන්ගේ විප්ලවවාදි ව්‍යායාමයට ඉතා හිතවත් මිනිසකු වුව ද රළු කරළු සහ උපායෙහි අදක්ෂ විය.

3 සහෝදර මාඕ සේතුං, සමාජ තත්වයන් ගැන විමසාබැලීම නායකත්වය දීමේ වැඩයේදී ප්‍රතිපත්තිය පැහැදිලි කොට පැනවීම පිණිස ඉතා ම වැදගත් කර්තව්‍යය සහ පදනම වශයෙන් සලකමින්, සැම විට ම විමසාබැලීම බෙහෙවින් අවධාරණය කර ඇත. සහෝදර මාඕ සේතුංගේ මූලපිරුම පිට රතු හමුදාවේ සිව්වැනි හමුදාවෙහි විමසාබැලීමේ වැඩ අනුක්‍රමයෙන් දියුණු කරනු ලැබී ය. ඔහු සමාජ තත්වයන් ගැන විමසාබැලීම වැඩ වලට අයත් නිතිපතා කළ යුතු කොටසක් විය යුතු ය'යි නියම කළේ ය; රතු හමුදාවේ දේශපාලන කාර්යාංශය බහුජන අරගලය පවතින තත්වය, ප්‍රතිගාමීන්ගේ තත්වය, ජනතාවගේ ආර්ථික ජීවිතය සහ ගම්බද ප්‍රදේශයන්හි එක් එක් පංක්තියට අයිතිව තිබෙන ඉඩම් ප්‍රමාණය වැනි මාතෘකා ඇතුළත් විස්තර සහිත ආකෘති පත්‍ර සම්පාදනය කළේ ය. රතු හමුදාව ගිය හැම තැනකදී ම, එය පළමුකොට ඒ ප්‍රදේශයේ පංක්ති තත්වය හොඳට දැන හැඳින ගත්තේ ය, ඉක්බිති බහුජනතාවගේ උවමනාවන්ට සරිලන විධියේ සටන්පාඨ සකස් කළේ ය.

4 මෙහි "කඳු" නම් චියාංසි සහ හුනාන් පළාත් වල දේශසීමාව ඔස්සේ පිහිටි චිංකාං පර්වත ප්‍රදේශය යි; "තැනිතලා" දකුණු චියාංසි සහ බටහිරි පූචියන් පළාත් වල පිහිටි තැනිතලා යි. 1929යේ ජනවාරියේදී, සහෝදර මාඕ සේතුං විශාල විප්ලවවාදි කඳවුරු ප්‍රදේශ දෙකක් පිහිටුවීම පිණිස රතු හමුදාවේ සිව්වැනි හමුදාවේ ප්‍රධාන සේනාව චිංකාං පර්වත වල සිට දකුණු චියාංසි සහ බටහිරි පූචියන් වලට රැගෙන ආවේය.

5 "ලියවිලි පොත" 1928 ජූලි මාසයේදී පවත්වනලද චීන කොමියුනිස්ට් පක්ෂයේ හයවැනි ජාතික සම්මේලනයේදී සම්මත වූ යෝජනා වලින් යුක්ත විය; දේශපාලන යෝජනාව සහ ගොවි ප්‍රශ්නය, ඉඩම් ප්‍රශ්නය, දේශපාලන බලය සංවිධානය කිරීම යනාදිය ගැන යෝජනා ඊට ඇතුළත් විය. 1929යේ මුලදී රතු හමුදාවේ සිව්වැනි හමුදාවේ පෙරමුණු කොමිටිය මේ යෝජනා රතු හමුදාවේ පක්ෂ සංවිධාන වලට සහ ප්‍රාදේශික පක්ෂ සංවිධාන වලට බෙදා දීම පිණිස පොතක් වශයෙන් මුද්‍රණය කළේ ය.

LIBERATIONBASE
ඩිජිටල් පුස්තකාලය

ඩිජිටල් පුස්තකාලය සහ ලේඛණ සංරක්ෂණ ව්‍යාපෘතිය
ආරම්භය (***NMSG Library*** ලෙස): 2010
LIBERATIONBASE ලෙස නැවත නාමකරණය: 2013

සූචිකරණ දත්ත

- කෘතිය: පොතට වහල් වීමට විරුද්ධ වන්න
- කතෘ/පරිවර්තක: මාඕ සේතුං/-
- ප්‍රකාශක: ප්‍රජා ප්‍රකාශකයෝ, කොළඹ
- පළමු ඩිජිටල් පළ කිරීම: 2019-05-31
- ඩිජිටල් සංස්කරණයන්: V1:2019-05-29
- පිටු ගණන: 17
- භාෂා මාධ්‍ය: සිංහල
- ගොනු ආකෘතිය: PDF

Web: https://liberationbase.wordpress.com
Email: slradical@ymail.com